සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**06 ශ්‍රේණිය** **තෙවන වාර පරීක්ෂණය - 2024** **43 S**

**නම: ..............................................................** **චිත්‍ර කලාව - I, II** **කාලය පැය දෙකයි**

## I කොටස

**සැලකිය යුතුයි.**

- **සියළුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු ලියන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**

01. බෞද්ධ පූජනීය ස්ථානවල ඉදිකර ඇති ස්තූප, ගර්භයේ හැඩය අනුව වර්ග ....................................... කට බෙදා ඇත.

02. හින්දු දේවාලයෙහි ඉදිරිපස තොරණක ආකාරයට ඉදිකර ඇති කොටස ....................................... නමින් හැඳින්වේ.

03. මුස්ලිම් පල්ලියේ වහළයේ උල් වූ තුඩක් සහිත ගෝලාකාර නිර්මාණය ....................................... නමින් හඳුන්වයි.

04. මෙරට ඉදිකර ඇති ක්‍රිස්තියානි දේවස්ථාන රෝමානු හා .............................. යන නිර්මාණ ශෛලී දෙක අනුව නිර්මාණය කර ඇත.

05. සිංහල සැරසිලි මෝස්තර අතර ඇති අරිම්බුව, ගල් බිංදුව, කුන්දිරක්කම්, පනාව, තනිපොට ලණුව, දෙපොට ලණුව ආදිය ....................................................... සැරසිලි ගණයට අයත් වේ.

**ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

06. වර්ණවත් කඩදාසි විවිධ හැඩතලවලට ඉරා ඇලවීමෙන්.........................
    i. දියසායම් මාධ්‍ය චිත්‍රයක් නිර්මාණය කරගත හැකිය.
    ii. කොලාජ් මාධ්‍ය චිත්‍රයක් නිර්මාණය කරගත හැකිය.
    iii. තෙල් සායම් මාධ්‍ය චිත්‍රයක් නිර්මාණය කරගත හැකිය.
    iv. පැස්ටල් මාධ්‍ය චිත්‍රයක් නිර්මාණය කරගත හැකිය.

07. පැන්සල භාවිතා කර යම් වස්තුවක හැඩයක් ඇඳ, එළිය අඳුර යොදා වර්ණ කිරීමෙන්, එම වස්තුවේ,
    i. උස පමණක් මතු වී පෙනේ.
    ii. දිග පමණක් මතු වී පෙනේ.
    iii. ත්‍රිමාණ ලක්ෂණ මතු වී පෙනේ.
    vi.පළල පමණක් මතු වී පෙනේ.

08. පංතියේ දී ඔබ විසින් පොත් පිටකවර නිර්මාණය කර තිබේ. පොත් පිට කවර නිර්මාණය අයත් වන්නේ,
    i. ග්‍රැෆික් සැලසුම් ගණයට ය.
    ii. මොස්තර නිර්මාණය ගණයට ය.
    iii.රේඛා චිත්‍ර ගණයට ය.
    vi.. පාරම්පරික සැරසිලි ගණයට ය.

09. ප්‍රධාන වර්ණ දෙකක් මිශ්‍ර වීමෙන් ද්විතීයික වර්ණ සැදේ. පහත සඳහන් වර්ණ අතුරින් ද්විතීයික වර්ණ වන්නේ
    i. නිල්, රතු, කහ ය. ii. දම්, කොළ, තැඹිලි ය.
    iii.රතු, සුදු, කළු ය. iv. අළු, දුඹුරු, නිල් ය.

10. පංති කාමරයේ දී කුරුල්ලෙකුගේ රුවක් ඇඹීමට භාවිත කරනුයේ,
    i. දිය සායම් ii.පැස්ටල් iii. රටහුණු vi. පදම්කල මැටි

• **අංක 11 සිට 15 තෙක් දී ඇති රූප සටහන් සඳහා ABCDE රූප වලින් ගැලපෙන රූපය තෝරා යා කරන්න.**

11. 

12. 

13. 

14. 

15. 


A


B


C


D


E

• **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළව දී ඇති වාක්‍යය හරිනම් (✓) ලකුණද වැරදිනම් (×) ලකුණද වරහන තුල යොදන්න.**

16. සිදුහත් කුමරුගේ උත්පත්තිය, බුද්ධත්වයට පත්වීම, පිරිනිවන් පෑම යන තෙමගුල සිහි ගන්වමින් ලෝකවාසී බෞද්ධ ජනතාව වෙසක් උත්සවය සමරනු ලබයි. (............)

17. තෛපොංගල් උත්සවයේ දී ගෙබිම අලංකාර කිරීමට කෝලං රටා යොදා ගනු ලැබේ. (............)

18. රාමසාන් උත්සවය ඉස්ලාම් ජනතාවට සුවිශේෂී උත්සවයක් නොවේ. (............)

19. සෑම වර්ෂයකම දෙසැම්බර් 24 දින මධ්‍යම රාත්‍රියේ ජේසුස් වහන්සේගේ උපත උත්සවාකාරයෙන් සමරනු නොලැබේ. (............)

20. බෞද්ධ ස්තූපයක මුදුනෙහිම චූඩා මාණික්‍යය දක්නට ලැබේ. (............)

(ල.2×20=40)

## II කොටස

• **සැලකිය යුතුයි.**
• **සෑම සිතුවමක්ම වර්ණ කර නිමා කළ යුතුය.**
• **පහත සඳහන් මාතෘකා වලින් එක් මාතෘකාවක් තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.**

01. බඩු ගැනීමට සෙනග පිරුණු ගම්බද කඩයක්
02. ආගමික වතාවත් ඉටුකරන ජනයා
03. පාසලේ පවත්වන නිවාසාන්තර ක්‍රීඩා උත්සවයකට ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.
04. ආගමික උත්සවයක් සඳහා සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.
05. ද්වීතියික වර්ණ යොදා ගනිමින් අලංකාර තෑගි දවටනයක් නිර්මාණය කරන්න.
06. මලක් සහ කොළයක් යොදා ගනිමින් චීත්ත රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.

(ල.60)